61755



*සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved*]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

| | | |
|---|---|---|
| **සංගීතය (පෙරදිග)** | **I, II** | *පැය තුනයි* |
| சங்கீதம் (கீழைத்தேய) | **I, II** | *மூன்று மணித்தியாலம்* |
| **Music (Oriental)** | **I, II** | *Three hours* |

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

| | |
|---|---|
| **අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි** | **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.** |
| மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள் | |
| Additional Reading Time - 10 minutes | |

## සංගීතය (පෙරදිග) I

*උපදෙස්:*

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ආරෝහණයේ ස්වර පහක් සහ අවරෝහණයේ ස්වර හයක් යෙදෙන රාගයකට අදාළ වන රාග ජාතිය අයත් වරණය තෝරන්න.

(1) ඖඩව – සම්පූර්ණ (2) ෂාඩව – ඖඩව
(3) ෂාඩව – සම්පූර්ණ (4) ඖඩව – ෂාඩව

**2.** නිර්දේශිත රාග දෙකක සර්ගම් අන්තරා කොටස් | ග ග ප ධ | ප ස̇ – ස̇ | සහ | ග ග ග ග | ප ප ස̇ ධ | යනුවෙන් ආරම්භ වේ. එම රාග යුගල පිළිවෙළින් සඳහන් වන වරණය තෝරන්න.

(1) භූපාලි සහ යමන් (2) යමන් සහ භූපාලි
(3) යමන් සහ බිලාවල් (4) භූපාලි සහ බිලාවල්

**3.** රාගයක සුවිශේෂී ලක්ෂණ යටතේ එකවර අත් හැරිය **නොහැකි** ස්වර දෙක මොනවාද?

(1) ෂඩ්ජය සහ මධ්‍යමය (2) මධ්‍යමය සහ ධෛවතය
(3) ෂඩ්ජය සහ පංචමය (4) මධ්‍යමය සහ පංචමය

**4.** | නි̲̣ ස ග̲ ම | ප – ග̲ ම | ප – රි රි | නි̣ රි ස – | මෙහි මුල් විභාග දෙක තුළ එක් රාගයකට අයත් ස්වර ද අවසන් විභාග දෙක තුළ තවත් රාගයකට අයත් ස්වර ද ඇතුළත් ව ඇත. එම රාග දෙක වන්නේ,

(1) භෛරවී සහ භූපාලි ය. (2) භෛරවී සහ යමන් ය.
(3) කාෆි සහ භූපාලි ය. (4) කාෆි සහ යමන් ය.

**5.** නිර්දේශිත තාලයක තබ්ලාවේ දැතින්ම වයන එකම අක්ෂරයක් සමග තනි අතින් වයන අක්ෂර දෙකක් පමණක් ඇතුළත් වේ. එම තාලය කුමක් ද?

(1) දාදරා (2) ත්‍රිතාල් (3) ජප්තාල් (4) දීප්චන්දි

**6.** නිර්දේශිත රාග අතුරෙන් මීන්ඩ් ශිල්ප ක්‍රමය නිවැරදිව විදහා දැක්වෙන ස්වර සංගතිය හා රාගය තෝරන්න.

(1) ධ ⁀නි ස̇ – බිලාවල් (2) ⁀ප රි ස – යමන් (3) ප ⁀ප ස̇ – කාෆි (4) ස ⁀රි̲ ස – භෛරවී

**7.** ස රි ප ම, රි ග ධ ප ලෙස ආරෝහණ ක්‍රමයට ගොඩනැගෙන ස්වර අභ්‍යාසයේ අවරෝහණ ක්‍රමයට ගොඩනැගෙන මුල් පියවර දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) ස̇ නි ප ම, නි ධ ම ග (2) ස̇ නි ප ම, නි ධ ග ම
(3) ස̇ නි ප ධ, නි ධ ම ග (4) ස̇ නි ම ප, නි ධ ග ම

[දෙවෙනි පිටුව බලන්න

8. මාත්‍රා සංඛ්‍යාව සමාන ලෙස විභාගවලට බෙදී ඇති තාල දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
(1) කෙහෙර්වා - දීප්චන්දි (2) දාදරා - කෙහෙර්වා
(3) ජප්තාල් - දීප්චන්දි (4) කෙහෙර්වා - ජප්තාල්

9. වාදි හා සංවාදි ස්වර යුගලය ලෙස ගාන්ධාරය සහ ධෛවතය හෝ ධෛවතය සහ ගාන්ධාරය යෙදෙන රාග යුගලය ඇතුළත් වරණය තෝරන්න.
(1) භූපාලි සහ බිලාවල් (2) යමන් සහ භූපාලි
(3) බිලාවල් සහ යමන් (4) භූපාලි සහ කාෆි

10. සුෂිර වාද්‍ය සහ ඝන වාද්‍ය ගණයට අයත් වන වාද්‍ය භාණ්ඩ යුගලය වන්නේ පිළිවෙළින්
(1) දිල්රුබාව සහ ජලතරංගයයි. (2) බටනලාව සහ තබ්ලාවයි.
(3) බටනලාව සහ ජලතරංගයයි. (4) දිල්රුබාව සහ තබ්ලාවයි.

11. ගාන සමය දිවා ප්‍රථම ප්‍රහරයට යෙදෙන රාග යුගලය තෝරන්න.
(1) භෛරවී සහ බිලාවල් (2) කාෆි සහ බිලාවල්
(3) භෛරවී සහ භූපාලි (4) භූපාලි සහ කාෆි

● අංක 12 සිට 15 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු තේරීම සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරු කර ගන්න.

| ස̇ – | ධ ධධ ප | මග ම | රි රි සස |
| සරි ගරි | ග + ගප | ධප ධ | + ගප ධනි |

රේඛා නම් ශිෂ්‍යාව විසින් මිශ්‍රාබය ආධාරයෙන් ස්වර වාද්‍ය භාණ්ඩයකින් ඉහත වාදිතය වාදනය කළ අතර, ඊට තබ්ලා වාදනයෙන් සහය වූ හංසිකා නම් ශිෂ්‍යාව විසින් එහි දෙවන ස්වර ආවර්තයට ධගෙ තිට ධා + යන කොටස තෙවරක් වාදනය කර අවසන් කරන ලදී.

12. රේඛා විසින් වාදනය කළ වාද්‍ය භාණ්ඩය කුමක් ද?
(1) වයලීනය (2) සිතාරය (3) සරෝද්‍ය (4) එස්රාජය

13. ඉහත දැක්වෙන ස්වර පාද දෙක ඇතුළත් නිර්දේශිත රාගය කුමක් ද?
(1) බිලාවල් (2) යමන් (3) කාෆි (4) භෛරවී

14. ධගෙ තිට ධා + තබ්ලා අක්ෂර සංයෝගයෙන් කළ ශිල්ප ක්‍රමය හඳුන්වනු ලබන්නේ
(1) මුකුඩා නමින් ය. (2) කායදා නමින් ය. (3) රේලා නමින් ය. (4) තිහායි නමින් ය.

15. ඉහත ස්වර ප්‍රස්තාරය අයත් වන තාලය කුමක් ද?
(1) ත්‍රිතාල් (2) ජප්තාල් (3) දීප්චන්දි (4) කෙහෙර්වා

16. උත්තර භාරතීය රාගධාරී සංගීතයේ භාවිත වන, අළුවෙන් (bow) වැයෙන සංගීත භාණ්ඩ අතුරෙන් පර්දා (frets) සහිත සහ පර්දා රහිත භාණ්ඩ යුගලය පිළිවෙළින් දැක්වෙන වරණය කුමක්ද?
(1) වයලින් - එස්රාජ් (2) ගිටාර් - දිල්රුබා
(3) දිල්රුබා - වයලින් (4) මැන්ඩලින් - ගිටාර්

17. හින්දි සිනමාවේ 60-70 දශකයේ ජනප්‍රිය චිත්‍රපට සංගීත අධ්‍යක්ෂකවරයෙකු වූයේ
(1) විශ්වනාත් ලෞජි ය. (2) අබ්දුල් සතාර් ය.
(3) එස්. ඩී. බර්මන් ය. (4) ඒ. ආර්. රහුමාන් ය.

18. උච්ච ෂඩ්ජයේ කම්පන වාර සංඛ්‍යාව හර්ට්ස් 512 ක් වූ විට මධ්‍ය පංචමයේ කම්පන වාර සංඛ්‍යාව හර්ට්ස්
(1) 320 කි. (2) 340 කි. (3) 384 කි. (4) 440 කි.

19. පහත සඳහන් ගීත අතුරෙන් ලයනල් රන්වල මහතා විසින් නිර්මාණය කළ ගීතය තෝරන්න.
(1) මේ අවුරුදු කාලේ (2) තෙල් ගාලා හිස පීරන් නැනෝ
(3) දෑසමන් මලක් වගෙයි ප්‍රියංකරයි (4) රුක් අත්තන මල මුදුනේ

[තුන්වෙනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

61755



**20.** ප්‍රශස්ති ගී පාදක කරගනිමින් නිර්මාණය වූ සරල ගී පාදය තෝරන්න.

(1) දෑතට වළලු මල් මුතුවැල් මාල පොටයි

(2) තෙදිනි විරාජ රුවිනි විරාජ රුහුණු සුරාජ කඳ දෙව්රාජ

(3) මල්සරා බැල්ම හෙළා මගේ හිතට කොඳුරනවා

(4) කඳුළු හෙළා නැඹිලියට සහල් ගරන අම්මා

**21.** 'සියක් ආයු ලැබ මගෙත් ආයු ගෙන මටත් වඩා කල් ඔබ ජීවත් වේවා' මෙම ගී පාදයේ සඳැස්මත් ගණන

(1) 28 කි. (2) 30 කි. (3) 32 කි. (4) 34 කි.

**22.** | ගුං – ද | දෙ ග ත | ග දි ග | ත ගු ද | මෙම බෙර පදය වාදනයට සුදුසු අවනද්ධ වාද්‍ය භාණ්ඩය කුමක්ද?

(1) දවුල (2) පහත රට බෙරය (3) ගැටබෙරය (4) උඩැක්කිය

**23.** 'සිසිල ගෙනදෙයි හමන මඳ නළ'

යන ගී පාදයේ මත් කැටිවීම නිවැරදිව සඳහන් වන තාලය තෝරන්න.

(1) දීප්චන්දි (2) ජප්තාල් (3) බෙම්ටෝ (4) දාදරා

**24.** සිංහල ග්‍රැමෆෝන් ගීත සඳහා මුලින්ම යොදා ගත්තේ

(1) දේශාභිමාන ගීත ය. (2) චිත්‍රපට ගීත ය. (3) නාඩගම් ගීත ය. (4) නූර්ති ගීත ය.

**25.** මනමේ නාට්‍යයේ ඇතුළත් 'නන් සිරින් වොරැඳි' ගී තනුවට පාදක වූ ඉයුජින් නාඩගමේ ඇතුළත් ගීතය කුමක්ද?

(1) යානත අතුල් මල්පෙති (2) මෙමගින් ගිය රුසිරු එතරුණා

(3) දුල්නිමල් සිසිසේ දිසි සරදඹරේ (4) සත්හට සෙත් දෙන

**26.** 'අම්මාවරුනේ' ගීතයේ පද රචනය, ගායනය සහ සංගීත නිර්මාණය කරන ලද පුද්ගලයන් තිදෙනා පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

(1) සුනිල් දයානන්ද කෝනාර, සුජාතා අත්තනායක, රෝහණ වීරසිංහ

(2) බන්දුල නානායක්කාරවසම්, නන්දා මාලනී, වී. හේමපාල පෙරේරා

(3) සුනිල් ආරියරත්න, නන්දා මාලනී, ප්‍රේමසිරි කේමදාස

(4) ධර්මසිරි ගමගේ, නන්දා මාලනී, ප්‍රේමසිරි කේමදාස

**27.** නීතිඥ ජෝන් ද සිල්වා සූරීන් විසින් නිෂ්පාදනය කළ නූර්තිය කුමක් ද?

(1) විධුර (2) පද්මාවතී (3) රොලීනා (4) රාමායනය

**28.** තිර්ලානා හා දීප්චන්දි යන අවනද්ධ තාල සඳහා යොදා ගැනෙන රංග ශෛලීන් දෙක වන්නේ පිළිවෙළින්

(1) නූර්ති සහ නාඩගම් ය. (2) නාඩගම් සහ නූර්ති ය.

(3) නවනාට්‍ය සහ නූර්ති ය. (4) නාඩගම් සහ නවනාට්‍ය ය.

**29.** 'මධුර ජවනිකා' නාට්‍යයේ 'නෛයිනගේ සුදුව' ගීතය ගායනා කරන නාට්‍ය චරිත දෙක වන්නේ

(1) අන්දරේ සහ අන්දරේවතී ය. (2) කුස සහ පබාවතී ය.

(3) ජැංඩි සිංඤෝ සහ රෝසනෝනා ය. (4) කවියා සහ පඬිතුමා ය.

**30.** ඩබ්ලිව්. ඩී. අමරදේව සූරීන් සංගීත අධ්‍යක්ෂණයෙන් හා ගීත ගායනයෙන් දායක වූ නිර්දේශිත චිත්‍රපටය සහ එම ගීතය නිවැරදිව සඳහන් වරණය තෝරන්න.

(1) සත්සමුදුර – සිනිඳු සුදු මුතු (2) රන්මුතුදූව – පාරමිතා බල

(3) හුලවාලි – කුඩා ගමේ මද්දහනේ (4) සැඩසුළං – ජීවන මේ ගමන සංසාරේ

**31.** ගුණදාස කපුගේ විසින් ගායනා කරන ලද 'උන්මාද සිතුවම්' ගීතයෙහි සංගීත අධ්‍යක්ෂණය කරන ලද්දේ

(1) වික්ටර් රත්නායක විසින් ය. (2) සෝමදාස ඇල්විටිගල විසින් ය.

(3) සරත් දසනායක විසින් ය. (4) ගුණදාස කපුගේ විසින් ය.

**32.** අපරදිග සංගීතයේ E Major Chord සඳහා යොදා ගැනෙන ස්වර තුන වන්නේ,

(1) E $A^b$ B ය. (2) E $F^\#$ B ය. (3) E A B ය. (4) E G B ය.

[හතරවෙනි පිටුව බලන්න

**33.** F Major ස්කේලයට අයත් ස්වර සඳහන් වන වරණය තෝරන්න.

(1) F G A B C D E F
(2) F G A B$^b$ C D E F
(3) F G A B$^b$ C D E$^b$ F
(4) F G A$^b$ B$^b$ C D E$^b$ F

**34.** Natural Minor සිද්ධාන්තයට අනුව G Natural Minor ස්කේලයට අයත් ස්වර සඳහන් වන වරණය තෝරන්න.

(1) G A B$^b$ C D E F G
(2) G A B$^b$ C D E F$^\#$ G
(3) G A B$^b$ C D E$^b$ F G
(4) G A B$^b$ C D E$^b$ F$^\#$ G

**35.** එරොයිකා, පැස්ටරෝල් යන සංධ්වනි රචනා කළ අපරදිග සංගීතඥයා වූයේ

(1) අමදියෙස් මොසාර්ට් ය.
(2) ජෝසප් හේඩ්න් ය.
(3) ජොහාන් සෙබස්තියන් බාර්ක් ය.
(4) ලුඩ්විග් වැන් බීතෝවන් ය.

**36.** සම්ප්‍රදායික සංගීත භාණ්ඩවල නාදය පටිගත කර, ඒවා ස්වර අනුපිළිවෙළින් කොටස් වශයෙන් සකසා MIDI KEY BOARD වැනි බාහිර උපාංග ඇසුරෙන් හසුරුවා ගත හැකි නාද පෙළ හැඳින්වෙන්නේ

(1) E Music නමින් ය.
(2) Sound Card නමින් ය.
(3) Sound Fonts නමින් ය.
(4) E Learning නමින් ය.

**37.** තාරතාවය, විපුලතාවය සහ ධ්වනිගුණය යන නාදයේ ත්‍රිවිධ ගුණ අතුරෙන් තාරතාවය හැඳින්වීම සඳහා බටහිර සංගීතයේදී භාවිත වන නාමය කුමක් ද?

(1) Pitch (2) Timber (3) Magnitude (4) Compression

**38.** නාද තරංගයක ගොඩ නැගෙන ශීර්ෂ මගින් වායු අනු එකිනෙක තෙරපීම හඳුන්වනු ලබන්නේ

(1) විරලනය නමින් ය.
(2) සම්පීඩනය නමින් ය.
(3) පරාවර්තනය නමින් ය.
(4) නාද නිෂ්පත්තිය නමින් ය.

**39.** අපරදිග වාද්‍ය භාණ්ඩ වර්ගීකරණය අනුව සමාඝාත (Percussion) කොටසට අයත් වන වාද්‍ය භාණ්ඩය තෝරන්න.

(1) චෙලෝ (Cello)
(2) ක්ලැරිනට් (Clarinet)
(3) කොරැන්ගලී (Cor-Anglais)
(4) ග්ලොකන්ස්පීල් (Glockenspiel)

**40.** සංගීතය පටිගත කර නැවත ශ්‍රවණය සඳහා ගබඩා කර තැබිය **නොහැකි** උපකරණය කුමක්ද?

(1) SD Card
(2) Audio Cassette Tape
(3) Amplifier
(4) USB Flash Drive

* *

[පස්වෙනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

40 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

සංගීතය (පෙරදිග) I, II
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

## සංගීතය (පෙරදිග) II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) විවාදී ස්වර ද ඇතුළත්ව ස්වර 12 ම භාවිත කළ හැකි සර්වකාලීන රාගය නම් කරන්න.

(ii) කාෆි රාගයේ යෙදෙන එක් විවාදි ස්වරයක් නම් කරන්න.

(iii) අටවන මාත්‍රාව මත ඛාලිය යෙදෙන නිර්දේශිත තාලය නම් කරන්න.

(iv) ස රි ප යන ස්වර අනුවාදී වශයෙන් යෙදෙන රාගය නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් ඇති ප්‍රශ්න යටතේ යෙදී ඇති හිස් තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) 'මව්පියො ආදී' ලෙස ආරම්භ වන ග්‍රැමෆෝන් ගීතය ගායනය කර ඇත්තේ කෝකිලදේවී වීරතුංග සහ ................................ විසිනි.

(vi) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීතයක් වන 'එන්ඩද මැණිකේ මමත් දියඹට' ගීතයේ සංගීත නිර්මාණය කර ඇත්තේ ................................ සූරීන් විසිනි.

(vii) 'කුමටද සොබනියේ, ඇහැල මලින් ගස් පිරිලා' යන ගීත ඇතුළත් දයානන්ද ගුණවර්ධන සූරීන්ගේ නරිබෑනා නාට්‍යයේ සංගීත නිර්මාණය කර ඇත්තේ ................................ සූරීන් විසිනි.

(viii) 'ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා' ගීතය ශ්‍රී ලංකා සරල ගීත ක්ෂේත්‍රයේ භාවිත වන ........................ ප්‍රකාශිත නිර්දේශිත ගීතයකි.

(ලකුණු 01 × 08 = 08 යි)

- අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ix) 'මෝරා බීජයෙනා' වශයෙන් පද යෙදෙන (a) ........................... වන්නම ගයනු ලබන්නේ (b) .............................. තිතට ය.

(x) 'අතට වෙරළු ඇහිඳ ගෙනේ' මෙම ගී පාදයේ ඇතුළත් ලඝු අකුරු ගණන (a) ........................ කි. ගුරු අකුරු ගණන (b) ........................ කි.

(ලකුණු 02 × 02 = 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

**2.** පහත A, B සහ C අක්ෂර යටතේ දක්වා ඇති රාග සංගති ලක්ෂණ සලකන්න.

A – ශුද්ධ මධ්‍යමය භාවිත රාත්‍රී කාලයේ ගාන සමය යෙදෙන රාගය

B – විකෘති ස්වර එකක් පමණක් ඇතුළත් රාගය

C – දිවා ප්‍රථම ප්‍රහරයේ ගාන සමය යෙදෙන සඩ්ජය සංවාදි වන රාගය

(i) ඉහත A, B සහ C අක්ෂර යටතේ සඳහන් ලක්ෂණවලින් පිළිබිඹු වන හින්දුස්තානි රාග තුන අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) ඉහත B හෝ C යන රාග අතරින් එක් රාගයකට අදාළව මධ්‍යලය ගීතයක ස්ථායී කොටස සහ ඊට අදාළ තානාලංකාරයක් නියමිත තාල සංඥා යොදා ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි)

(iii) ඉහත A, B සහ C යන රාග අතරින් ඔබ විසින් (ii) කොටස සඳහා තෝරාගත් රාගය හැර, වෙනත් රාගයක මේලය, ජාතිය, මුඛ්‍යාංගය, ගාන සමය, අරෝහණය සහ අවරෝහණය රාගයේ නම සමග ලියා දක්වන්න. (ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

**3.** නිර්දේශිත රාග දෙකකට අයත් වාදිතයක මුල් ආවර්තයක් සහ තානාලංකාරයක් A සහ B වශයෙන් පහත දැක්වේ.

A

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| ග – ග රි | ග පප ධ ප | ග රි ග රි | ස ධ̣ ස රි |

B

| x | 2 | 0 | 3 |
|---|---|---|---|
| ගප ධනි ස̇නි | ධප මග මරි ස– | ගම පග මරි | ගරි ගප ධනි ස̇– |

(i) ඉහත A හා B ස්වර ප්‍රස්තාර කොටස් අයත් රාග දෙක අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත A අක්ෂරයෙන් දැක්වෙන රාගයට අයත් මධ්‍යලය ගීතයක අන්තරා කොටසේ ස්වර ප්‍රස්තාරය, නියමිත තාල සංකේතය සමගින් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි)

(iii) ඉහත B අක්ෂරයෙන් දැක්වෙන තානාලංකාරයට අදාළ තාලය නම් කර, එම තාලයට අයත් ඨේකාව, නියමිත මාත්‍රා විභාග, තාල සංඥා යොදමින් ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි)

**(මුළු ලකුණු 12 යි)**

**4.** (i) "මහනුවර යුගයේදී ආරම්භ වූ ගීත විශේෂයක් ලෙස උඩරට වන්නම් හැඳින්විය හැකි ය."

පහත දැක්වෙන ශීර්ෂ ඔස්සේ ඒ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

A – පදමාලා නිර්මාණයට පාදක වූ තේමාවන්

B – පාදක වී ඇති සංගීත ආභාසය

C – භාවිත කළ අවනද්ධ භාණ්ඩ (ලකුණු 04 යි)

(ii) පතල් ගී හා බඹර ගී අතර සමානතා **දෙකක්** සහ අසමානතා **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඇදහිලි ගී යටතට එන ශාන්තිකර්ම ගී වර්ග නම් කර, ඉන් **එක්** වර්ගයකට අයත් ගී පාදයක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**5.** (i) පහත කියවීම් පත්‍රිකාව කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

> **කියවීම් පත්‍රිකාව**
>
> 'දුලා නෙතුපුලා', 'ප්‍රේමයෙන් මන රංජිතවේ නන්දිතවේ' වැනි රසවත් ගීත ගණනාවකින් යුත් මෙම නව නාට්‍යය අද දින රාත්‍රී 8.00 ට පේරාදෙණිය සරසවි බිමේදී එළි දැක්වීමට සියල්ල සූදානම් කර ඇත. දිවයිනේ ප්‍රසිද්ධ මද්දල් වාදන ශිල්පීන් දෙදෙනෙකු විසින් තාල වාදනය කරන අතර, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් චුල්ලධනුද්ධර ජාතක කතාව ආශ්‍රයෙන් මෙම නාට්‍ය නිෂ්පාදනය කර ඇත.

(a) ඉහත කියවීම් පත්‍රිකාවේ සඳහන් ගීත දෙක ඇතුළත් නව නාට්‍යය නම් කරන්න.

(b) එම නාට්‍ය වර්ගයටම අයත් වන වෙනත් නාට්‍ය **දෙකක්** නම් කර එම එක් එක් නාට්‍යයෙහි ඇතුළත් ගී පාදයක් බැගින් අදාළ නාට්‍යයෙහි නම ඉදිරියෙන් ලියා දක්වන්න.

(ලකුණු 05 යි)

(ii) නාඩගම් සහ නූර්ති ශෛලීන් හි සංගීතමය ලක්ෂණ **හතරක්** සංසන්දනය කර ලියා දක්වන්න.


(ලකුණු 04 යි)

(iii) පහතරට ශාන්ති කර්ම ගී ආභාසයෙන් ගී තනු නිර්මාණය වී ඇති රංග ශෛලිය හඳුන්වා එහි ඇතුළත් ගීතයක මුල් පාද **දෙකක්** ලියන්න.

(ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

**6.**




(i) ඉහත දක්වා ඇති අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (අපරදිග C ස්වරය පෙරදිග 'ස' ස්වරයට සමාන යැයි සලකන්න.)

(ලකුණු 04 යි)

(ii) ඉහත ප්‍රස්තාරයේ අංක 1 සිට 6 තෙක් අංකනය කර ඇති සංකේත අතරින් ඕනෑම **හතරක්** අදාළ අංකය සමග නම් කර ඉන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06 යි)

(iii) Semibreve Rest, Dotted Quaver, Dotted Crochet මෙම සංකේත අතරින් තෝරාගත් සංකේත **දෙකක** රූප සටහන් කෙටි ස්වර මණ්ඩලයක් (Short Staff) තුළ ඇඳ දක්වන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 12 යි)**

**7.** පහත සඳහන් ප්‍රශ්න අතුරෙන් ඕනෑම ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(i) චිත්‍රපට ගීත, සරල ගීත හා ග්‍රැමෆෝන් ගීත අතුරෙන් තෝරාගත් එක් ගී වර්ගයක සංගීතමය ලක්ෂණ පිළිබඳව පහත කරුණු ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න.

- ගී තනුව
- පෙර අතුරු වාදන
- සංගීත ශිල්ප ක්‍රම
- සංගීත ආභාසය

(ii) ලංකාවේ නිෂ්පාදිත ප්‍රථම සංධ්වනි කිහිපය නිර්මාණය කළ දේශීය ජන සංගීතඥයාගේ එම සංධ්වනි නිර්මාණ සහ වෙනත් සංගීත කෘතීන් පිළිබඳ ව ඇගයීමක් කරන්න.

(iii) සංගීත මෘදුකාංග යොදා ගනිමින් පරිගණකය ඇසුරින් ගීතයක් පටිගත කරන ආකාරය සරලව පැහැදිලි කරන්න.

[අටවැනි පිටුව බලන්න

(iv) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන දී ඇති ස්වර ප්‍රස්තාරයට ගැළපෙන ලෙස පදමාලාවක් නිර්මාණය කර, ස්වර පෙළට යටින් පද ප්‍රස්තාර කර දක්වන්න.

- පුන් පෝදා අසිරිය
- වසන්තය ඇවිත්
- මව්පිය ගුණ සුවඳ
- මගේ සුරතලා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ස | රි | ග | ම | — | — | — | රි | — | ග | ම | ප | — | — | — |
| ප | — | ම | ග | ම | — | ග | රි | ග | — | රි | නි̣ | ස | — | — | — |
| + | ග | — | ප | ධ | — | — | — | ප | — | ධ | නි | ස̇ | — | — | — |
| ස̇ | නි | ධ | ප | ම | — | ග | ම | ප | — | ග | රි | ස | — | — | — |

(ලකුණු 04 × 03 = 12 යි)

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300 | Rs : 300 | Rs : 300 | Rs : 300 | Rs : 300 | Rs : 300 | Rs : 350

Rs : 300 | Rs : 300 | Rs : 200 | Rs : 200 | Rs : 200 | Rs : 250


Rs : 250 | Rs : 200 | Rs : 200 | Rs : 200

Rs : 300 | Rs : 300 | Rs : 200 | Rs : 200 | Rs : 250 | Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY | VISA | mastercard | KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


# 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE